" විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "
ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE
204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone - 011 - 2093000

SLSI ISO 9001 · SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

මගේ අංකය / எனது இலக்கம் / My No. CSWP/ADM/18-38/FI/01-2023
ඔබේ අංකය / உமது இலக்கம் / Your No.
දිනය / திகதி / Date 2023.03. 23

ආණ්ඩුකාර ලේකම්(බ.ප.),
ලේකම්,පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.),
සභා ලේකම් (බ.ප.),
ලේකම්,(පළාත් පාලන/අධ්‍යාපන/කෘෂිකර්ම/ප්‍රවාහන/සෞඛ්‍ය) අමාත්‍යාංශය(බ.ප.),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/පිරිස් හා පුහුණු/මූල්‍ය/සැලසුම්/ඉංජිනේරු),
පළාත් ආදායම් කොමසාරිස්(බ.ප.),
ප්‍රධාන නීති නිලධාරී,නීති ඒකකය (බ.ප.),
අධ්‍යක්ෂ,අභ්‍යන්තර විගණන ඒකකය (බ.ප.),
ප්‍රධාන ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්/පරිපාලන නිලධාරී,

**මධ්‍යම රජයේ විවිධ අමාත්‍යාංශ වෙතින් ලැබෙන චක්‍රලේඛ (මූල්‍ය චක්‍රලේඛ හැර) බස්නාහිර පළාතට අදාල කර ගැනීමේ කමිටු තීරණ සඳහා අනුමැතිය ලබා ගැනීම**

උක්ත කරුණට අදාලව පහත සඳහන් චක්‍රලේඛ බස්නාහිර පළාතට අදාල කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමැතිය ලබා දී ඇති බව ආණ්ඩුකාර ලේකම්ගේ අංක GOS/ADM/6/2/19 හා 2023.01.04 දිනැති ලිපිය මගින් මා වෙත දන්වා ඇත.

| අනු අංකය | දිනය හා චක්‍රලේඛ අංකය | විස්තරය |
|---|---|---|
| 01 | 2018.05.31 පොදු චක්‍රලේඛ අංක 01-27/2018 | වාග් චිකිත්සක නිලධාරීන් සඳහා රාජකාරී වේලාවෙන් පරිබාහිරව පෞද්ගලික සේවයේ යෙදීමට අවසර ලබා ගැනීම. |
| 02. | 2018.06.23 පොදු චක්‍රලේඛ අංක 01-31/2018 | වෘත්තීය චිකිත්සක නිලධාරීන් සඳහා රාජකාරී වේලාවෙන් පරිබාහිරව පෞද්ගලික සේවයේ යෙදීමට අවසර ලබා දීම. |
| 03. | 2022.03.05 චක්‍රලේඛ ලිපි අංක 01-14/2022 | Guideline on Immunology testing criteria and sample transport. |
| 04. | 2020.01.31පොදු චක්‍රලේඛ අංක 01-11/2020 | සෞඛ්‍ය සේවයේ අමතර සේවා රාජකාරී,අතිකාල දීමනා හා සති අන්ත/නිවාඩු දින වැටුප් ගෙවීම. |
| 05. | 2022.10.28 රා.ප. චක්‍රලේඛ 18/2020(I) | රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම. |

| | | |
|---|---|---|
| 06. | 2022.11.03 රා.ප. චක්‍රලේඛ 31/2019(I) | ශ්‍රී ලංකා පරිපාලන සේවයේ සේවා ව්‍යවස්ථාවට අංක : 2137/5 හා 2019.08.19 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් ඇතුළත් කරනු ලැබූ සංශෝධනයන් ක්‍රියාත්මක කිරීම. |
| 07. | 2022.11.09 රා.ප. චක්‍රලේඛ 34/2019(I) | ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ සේවා ව්‍යවස්ථාවට අංක : 2137/26 හා 2019.08.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් ඇතුළත් කරනු ලැබූ සංශෝධනයන් ක්‍රියාත්මක කිරීම. |
| 08. | 2022.11.14 රා.ප. චක්‍රලේඛ 01/2020(I) | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ සේවා ව්‍යවස්ථාවට අංක : 2137/89 හා 2019.08.23 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් ඇතුළත් කරනු ලැබූ සංශෝධනයන් ක්‍රියාත්මක කිරීම. |
| 09. | 2022.11.14 රා.ප. චක්‍රලේඛ 05/2020(I) | ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ සේවා ව්‍යවස්ථාවට අංක : 2137/88 හා 2019.08.23 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් ඇතුළත් කරනු ලැබූ සංශෝධනයන් ක්‍රියාත්මක කිරීම. |
| 10. | 2022.11.21 රා.ප. චක්‍රලේඛ 33/2019(I) | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ සේවා ව්‍යවස්ථාවට අංක : 2137/66 හා 2019.08.22 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් ඇතුළත් කරනු ලැබූ සංශෝධනයන් ක්‍රියාත්මක කිරීම. |
| 11. | 2022.11.30 රා.ප. චක්‍රලේඛ 26/2022 | රජයේ නිලධරයන්ගේ ඇඳුම |

02. එකී චක්‍රලේඛ පරිදි කටයුතු කරන ලෙස ඔබ යටතේ සිටින සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්,ආයතන ප්‍රධානින් හා නිලධාරීන් දැනුවත් කරන ලෙසත් කාරුණිකව ඉල්ලා සිටිමි.

එස්.එම්.එච්.කුසුම්සිරි,
පරිපාලන නිලධාරී (පාලන),
ප්‍රධාන ලේකම් වෙනුවට,
බස්නාහිර පළාත.

දුරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112698507 , 0112694033
Telephone ) 0112675449 , 0112675280

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax ) 0112692913

විද්‍යුත් තැපැල, ) postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ් අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )

(77)

මගේ අංකය )
எனது இல ) TA/SA/02/2013
My No. )

ඔබේ අංකය )
உமது இல )
Your No )

දිනය )
திகதி ) 2018.05. 31
Date )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
சுகாதார, போசணை மற்றும் சுதேசவைத்திய அமைச்சு
Ministry of Health, Nutrition & Indigenous Medicine

පොදු චක්‍රලේඛ අංක:- 01 - 27 / 2018

සියලුම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරුන්,
සියලුම පළාත් සෞඛ්‍ය ලේකම්වරුන්,
ශ්‍රී ලංකා ජාතික රෝහලේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්,
සියලුම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,
සියලුම ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,
ශික්ෂණ රෝහල් සහ මහ රෝහල් අධ්‍යක්ෂවරුන්,
වෛද්‍ය අධිකාරීවරුන්,
අදාල ආයතන ප්‍රධානීන්,

**වාග් චිකිත්සක නිලධාරීන් සඳහා රාජකාරි වේලාවෙන් පරිබාහිරව පෞද්ගලික සේවයේ යෙදීමට අවසර ලබා දීම.**

"වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවන් සඳහා රාජකාරි වේලාවෙන් පරිබාහිරව පෞද්ගලික සේවයේ යෙදීමට අවසර ලබාදීම" යන මැයෙන් ගරු සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යතුමා විසින් 2016.10.21 දිනැතිව යොමු කළ සංදේශයට අදාලව අමාත්‍ය මණ්ඩල ලේකම්ගේ අංක අමප/ 16/2309/718/095 හා 2016.11.30 දිනැතිව ලැබී ඇති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා ඇති වාග් චිකිත්සක නිලධාරීන් සඳහා පහත සඳහන් කොන්දේසිවලට යටත්ව රාජකාරී වේලාවෙන් පරිබාහිරව පෞද්ගලික සේවයේ යෙදවීමට මෙයින් අවසර දෙනු ලැබේ.

කොන්දේසි:-

1. තම නිත්‍යානුකූල තනතුරට අදාලව පමණක් පෞද්ගලික සේවයේ යෙදිය යුතු අතර එක් නිලධාරියෙකු සඳහා පෞද්ගලික සේවයේ යෙදීමට අවසරය ඇත්තේ වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා ඇති එක් තනතුරක් සඳහා පමණි. තව ද, මෙම චක්‍රලේඛය මගින් පෞද්ගලික සේවයේ යෙදීමට අවසර ලබන නිලධාරීන් වෙනත් චක්‍රලේඛ හෝ විධිවිධාන මගින් වෙනත් සේවාවක් සඳහා පෞද්ගලික සේවයේ යෙදීමේ අවසර ලබා ඇත්තෙකු නොවිය යුතුය.

2. පෞද්ගලික සේවයේ යෙදෙන නිලධාරීන් අමාත්‍යාංශයේ ලේකම්වරයා / සෞඛ්‍ය විෂය භ... අදාල පළාත් අමාත්‍යාංශයේ ලේකම් වෙතින් ඒ සඳහා පූර්ව අනුමැතිය ලබා ගැනීමට කට... කළ යුතුය.

3. පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාවේ ලියාපදිංචිය සහිත ආයතනයක, ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා ඇති වෛද්‍යවරයකුගේ අධීක්ෂණය යටතේ වෛද්‍යවරයකු විසින් කර ඇති නිර්දේශ අනුව වාග් චිකිත්සක ප්‍රතිකර්ම ලබාදීම සිදු කළ යුතුය.

4. පෞද්ගලික සේවයේ යෙදෙන්නේ නම් එම යෙදෙන ආයතන පිළිබඳව සියලුම විස්තර (නම, ලිපිනය හා දුරකතන අංක යනාදිය) ආයතන ප්‍රධානියා වෙත ලිඛිතව දැන්විය යුතුය. අදාල නිලධාරියා රජයේ සේවයේ යෙදෙන ආයතනය හෝ රෝහල පිහිටි පළාත තුළ පමණක් පෞද්ගලික සේවයේ යෙදීමට ඔහුට / ඇයට අවසර ඇත.

5. ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි වුවද අනුස්ථාපන හා සමායෝජන පුහුණුවේ සිටින අභ්‍යාසලාභීන්ට පෞද්ගලික සේවයේ යෙදීමට නොහැක.

6. පෞද්ගලික සේවයේ යෙදීමට අවසර ලබා දෙනු ලබන්නේ සාමන්‍ය රාජකාරි වේලාවෙන් පරිබාහිරවය. සතියේ දිනවල සාමාන්‍ය රාජකාරි වේලාව පෙරවරු 8.00 සිට 4.00 දක්වා ලෙස සලකන අතර, රාජකාරියේ යෙදෙන සෙනසුරාදා, ඉරිදා සහ රජයේ නිවාඩු දිනවල හෝ පොරොත්තු සේවයක අත්‍යාවශ්‍ය සේවයේ යොදවා ඇති කාල සීමාව තුළ හෝ අතිකාල සේවයේ යෙදෙන කාල සීමාවන් තුළ පෞද්ගලික සේවයේ නොයෙදිය යුතුය. සේවා මුර ක්‍රමයක් අනුව සේවයේ යෙදෙන නිලධාරීන්ගේ අදාල සේවා මුර කාල සීමාව සාමාන්‍ය රාජකාරි වේලාව ලෙස සැලකෙන බැවින්, එම කාලය තුළ පෞද්ගලික සේවයේ යෙදීමට අවසර නැත.

7. අසනීප නිවාඩු, ප්‍රසූත නිවාඩු කාලය තුල පෞද්ගලික සේවයේ යෙදිය නොහැක. අනියම්/විවේක නිවාඩු ලබා සිටින නිලධාරියෙකුට තම රාජකාරි වේලාවෙන් පරිබාහිර කාලය තුල පෞද්ගලික සේවයේ යෙදීමට හැකියාව ඇත.

8. පෞද්ගලික සේවයේ යෙදෙන කාලසීමාව තුල අතිකාල දීමනා, 1/20 හෝ වෙනත් කිසිදු දීමනාවක් ලබා ගැනීමට කිසිදු හැකියාවක් නොමැත.

9. රෝහලේ / සේවා ස්ථාන, රජයේ නිල නිවාස / දෙපාර්තමේන්තුවෙන් ගෙවීම් කරනු ලබන නිල නිවාස ඇතුලුව රජයේ ආයතන තුල පෞද්ගලික සේවයේ යෙදීම නොකළ යුතුය.

10. රෝහලට / සේවා ස්ථානයට අයත් උපකරණ, වෙනත් පහසුකම් හෝ භෞතික සම්පත් පෞද්ගලික සේවා කටයුතු සඳහා කිසියේත්ම භාවිතා නොකල යුතුය.

11. පෞද්ගලික සේවයේ යෙදෙන නිලධාරීන් තම වෘත්තීය නාමය (වාග් චිකිත්සක) හැර රජයේ රාජකාරි නිල නාමයන්, රාජකාරි හැඳුනුම්පත් හා නිල ලාංඡන පෞද්ගලික සේවයේ යෙදෙන ස්ථාන වලදී භාවිතා නොකල යුතුය. කෙසේ නමුත්, පෞද්ගලික සේවයේ යෙදෙන අවස්ථාවේදී තමන් රජයේ සේවයේ යෙදෙන ආයතනයෙන් ඔහු / ඇය වෙත නිකුත් කර ඇති නිල හැඳුනුම්පත සහ ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි සහතිකය ළඟ තබා ගත යුතුය.

12. රජයේ රෝහලෙන් හෝ ආයතනයෙන් තමන්ට අවශ්‍ය සේවාවන් ලබා ගැනීමට අපේක්ෂිත රෝගීන් සඳහා සැමවිටම ප්‍රමුඛතාවය ලබා දිය යුතු අතර, තමන් වෙත පෞද්ගලික සේවය ලබා ගැනීමට පැමිනෙන රෝගීන් තමන් රජයේ සේවයේ යෙදෙන ආයතන/රෝහල වෙත පැමිණියහොත්, එවැනි අවස්ථාවකදී එම රෝගීන් වෙත වැඩි ප්‍රමුඛතාවයක්, සැලකිල්ලක් නොදැක්විය යුතුය. සාමාන්‍ය රෝගීන් සමඟ සම ප්‍රමුඛතාවක් පමණක් ලබා දිය යුතුය.

13. කිසිදු හේතුවක් මත රාජ්‍ය ආයතනවලට පැමිණෙන රෝගීන් පෞද්ගලික සේවා ස්ථාන සඳහා යොමු නොකළ යුතුය.

14. රාජකාරි වේලාවෙන් බාහිරව වන හදිසි කැඳවීමකදී මෙම නිලධාරීන්ගේ සේවය ඔවුන් රජයේ සේවයේ යෙදෙන රෝහලට/ආයතනයට ප්‍රමුඛතාවය ලැබෙන සේ බාධාවකින් තොරව ලබා දිය යුතුය.

ඉහත සඳහන් කොන්දේසි වලට පරිබාහිරව පෞද්ගලික සේවයේ යෙදෙන නිලධාරීන් හට විනයානුකූලව කටයුතු කරන බව දන්වමි.

මෙම චක්‍රලේඛයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර කිසියම් පරස්පරතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එහිදී සිංහල පාඨය බල පැවැත්වේ.

ජනක සුගතදාස
ලේකම්
සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

ජනක සුගතදාස,
ලේකම්,
සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය.

පිටපත - ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (හදිසි වැටලීම) - කරු. අවශ්‍ය කටයුතු සඳහා

පෙ: